The SINHALA
ISSN 1834-7061
Aug-2009



# යළි පැවූ සඳක්

## ආචාර්ය ෂෙල්ටන් පීරිස් ලියූ කෙටිකතාවකි

අයියාට අනුරාධපුරයේ ගුරු පත්වීමක් ලැබීම නිසා, අපට ගම හැරදා යාමට සිදුවීම ගැන අම්මා අකමැති නොවූවත් ඇය යම් පසුතැවිල්ලකින් සිටින බව මට දැනුණි.

'ඇයි අම්මෙ දුකින් වගේ ඉන්නේ. අම්මා කැමති නැද්ද අනුරාධපුරයට යන්න?'

'අනේ නැහැ මගේ රත්තරන් පුතේ. තාත්තා නැති උනාට පස්සෙ මම දැන් මෙහේ ඉඳලා මොකටද? ඒත් මගේ හිතට දුක මගේ එකම අයියව දාල යන්න වෙනවට. ආයෙ ඉතින් කවදා දකින්න වේවිද දන්නෙ නැහැනේ.' අම්මගෙ ඇස් වල කඳුළු.

'මාමා හෙට එනව කීව, නිශා කෙල්ල එක්ක උඹල බලල යන්න. හෙට රෑ දහයටනෙ පුතේ අපිට යන්න නැකත තියෙන්නෙ.'



'ඇයි නැන්ද එන්නෙ නැද්ද අම්මෙ?' මගේ උපහාස ප්‍රශ්ණයට අම්මාගේ පිළිතුර වූයේ සුසුමක්.

පසුදා රාත්‍රී අපි බඩු ලොරියට දමමින් සිටියදී, මාමා නිශා නංගි සමග පැමිණියේය.

'ඇයි සේන අයියෙ ඔයාලා මෙහේ දාලා යන්නෙ? අපි එක්ක තරහ වෙලාද? ඔයා හොඳට OL කරපු නිසා ආනන්දෙට ගිහිල්ලා AL කරන්න තිබුණනෙ?

'ඒත් නංගි අපේ අයියට ගුරු පත්වීම ලැබිල තියෙන්නේ අනුරාධපුරයටනේ. එහේ ගියාම මම ඉස්කෝලයක් හොයා ගන්නවා AL කරන්න.'

'සේන අයියේ. මේ බුදු රූපෙ ඔයාගෙ අලුත් කාමරේ තියාගන්න. හැමදාම මල් තියලා වඳින්න මාව මතක් වෙන්න.'

'මොනවද නංගි මම ප්‍රාර්ථනා කරන්නෙ වැන්දට පස්සෙ' මම ඇහුවෙ හිනාවෙමින්.

'මේ නිශා ලබන ආත්මෙදි ඔයාගෙම නංගි වෙන්න කියලා.' ඇය කීවෙ ඉකිබිඳිමින්. මට හරියට දුක හිතුණා නංගි ගැන.

අප අනුරාධපුරයට පැමිණ දෙවසරක් ගත වී ඇති බව සිතා ගත නොහැක.

මගේ උසස් පෙළ ප්‍රථිපල ඇසූ අම්මාගේ දෑසින් වැගුරුන සතුටු කඳුළු අතරින් 'මගෙ පොඩි පුතේ සියලු රත්නත්තරේ පිහිටෙන් උඹට හැමදාම ජයම ලැබෙන්න ඕන.' කියා මිමිනුයේ මොන තරම් සන්සුන්වද? මට අම්මා ගැන ඇති වූයේ හරිම භක්තියක්.

'තාත්තා හිටියනම් අද හරියට සතුටු වේවි මගේ පුතේ.' අම්මාගේ කට හඬට දුක්බර බවක් මුහුවෙලා.

ඒ සමගම මගේ සිත පසුගිය අවුරුදු දෙක තුනක අතීතයට ඇදී ගියේ නිරායාසයෙන්. අප මොරටුවේ සිටි කාලය, තාත්තාගේ අභාවය, නිශා නංගී, අයියාට අනුරාධපුරයේ ගුරු පත්වීමක් ලැබීම, අයියාගේත්, විශ්වකාන්ති අක්කාගේ විවාහය ඇතුළු සියල්ල සිතුවම් පටක් ලෙස ආවර්ජනය විය. මගේ හිත මිතුරන් බොහෝ දෙනෙකුට සරසවි වරම් ලැබීම ඒ සිතුවම් පටයේ තාවකාලික අවසානයක් විය. මා ඇතුළු දොලොස් දෙනෙකුට පේරාදෙණියට ඇතුල් වීමට වරම් ලැබුණි. තවත් පස් දෙනෙක් කොළඹටත් කැළණියටත් යාමට සූදානම් විය. අය්යාගේ පාසලින් පස්දෙනෙක් පේරාදෙණිය ඉංජිනේරු පීඨයටද, තුනක් පේරාදෙණිය වෛද්‍ය පීඨයටද, දෙකක් කටුබැද්ද ඉංජිනේරු පාඨමාළාව හැදෑරීමටද, පහක් කොළඹ විද්‍යා පීඨයට, විද්‍යාව හැදෑරීමටද තේරී තිබුණි. ගමේ සැමගේ සහාය ඔවුනට නොමදව ලැබුණි. ඔවුන් හැම දෙනාටම සුභ පැතීම පිණිස විශේෂ පිංකමක් පංසල් දායක සභාව විසින් සූදානම් කොට තිබුණි.

'මගේ සුභපැතුම්! මල්ලී එහෙනම්, දැන්මම පේරාදෙණි යන්න සූදානම් වෙන්න.' අක්කා කීවේ හරිම සතුටින්.

'ඒවා අක්කගෙ මහන්සියෙ ප්‍රතිඵල තමයි. අක්ක හොඳට පොහොර දැම්ම. අපි ප්‍රතිඵල නෙලා ගත්ත.'

පසුගිය මාස දෙක කෙසේ ගෙවී ගියා දැයි නොදැනේ. හැම දිනම පාහේ පාසලට ගොස් එහි නොයෙකුත් වැඩ වලට උපකාරි වූයේ කෘත ගුණ සැලකීමක් ලෙසය. මගේ සමත් වීම ගැන අසා නිශා නංගීද සුභ පතා ලිපියක් එවා තිබුණි.

මා දයාබර අය්යේ,

ඔබගේ උසස් පෙළ සමත් වීමත්, ඔබ ආශාවෙන්ම බලා සිටි පේරාදෙණියට ඇතුල්වීමට වරම් ලැබීමත් ගැන මගේ උණුසුම් සුභ පැතුම් පළමුව පිළිගන්න. තමන් කැමති දේම ලැබීම පෙර පිං කළ ඇත්තන්ට සිදුවන බව මම අසා ඇත්තෙමි. ලබන වසරේ උසස් පෙළ ගැන අවිනිශ්චිතව සිටි මා ඔබේ සමත් වීමෙන් ලැබුවේ මහත් උද්දාමයක්. මමද කෙසේ හෝ පේරාදෙණියට ඇතුල් වීමට උත්සාහ කරණ බවට අදිටන් කර ගතිමි. එවිට අපට නැවත හමුවිය හැකිය. පේරාදෙණියට මා පැමිණෙන තුරු ඔබ බලා සිටිනු ඇතැයි, මම තරයේ විශ්වාස කරමි. ඔබට සියලු ජය පතමි. තෙරුවන් සරණයි.

ඔබේ දයාබර නංගී,

නිශා.

'අපේ මල්ලි. මට කියන්න බැරි උනා. මගේ රූම් මේට් ධම්මිකා රණගල දැන් ඉන්නෙ යුනිවසිටි ක්වාටර්ස් වල. එයාගෙ හස්බන්ඩ් තමයි ඉකොනොමික්ස් ප්‍රොපෙසර් ඩොක්ටර් රංගසිරි ජයදේව. මම එයාට කෝල් කරල විස්තරේ කියන්නම්. කොහොමටත් එයාව දැනගන්න එක හොඳයි. මගේ හොඳම යාලුවානේ. අපේ වෙඩින් එකටත් ආව, මල්ලිට මතක නැතිව ඇති.'

අක්කාගේ විස්තරය ඇසූ ධම්මි අක්කා ඉතා සතුටට පත්වූ බවත්, සතියක් දෙකක් ඔවුන් සමග සිටිය හැකි බවත් ඇය කියා තිබුණා. මෙය නවක වදය ගැන මගේ හිතේ තිබුණ බය අඩු කිරීමට උපකාර වුණා.

අපේ ලියා පදිංචිවීමේ දිනය යෙදී තිබුණේ අප්‍රියෙල් විසි තුන්වන සඳුදා. අප්‍රියෙල් විසි දෙවන දින ඉරිදා පේරාදෙණියෙ යෑමට අප සූදානම් වුණා. අපේ අම්මා සහ අක්කාගේ අම්මාද එන බව කීවා. අප මහනුවර නගරයට ලඟාවන විට හවස දෙකට විතර ඇති. ➔

'අනේ ලොකු පුතේ, මට කාලෙකින් දළදා හමුදුරුවන් වැඳ පුදාගන්න බැරි වුණා. කොහොමටත් හොඳ වැඩක් පටන් ගන්න කලින් බාරයක් වෙන එක හොඳයි නේ' කියල අම්මා කීවා.

'ඒක නම් ඇත්ත තමයි පුතේ. ඒ නිසා අපි දළදා මාළිගයට යමු මුළින්ම'. අනුරාධපුර නැන්දා ද එය අනුමත කළා.

'මේ ඉස්කොලෙ මහත්තයෝ. අතනින් ගිහිල්ල මල් සහ හඳුන් කූරු ටිකක් අරගෙන එන්න.'

අක්කා සමහර විට අයියා ඇමතුවේ 'ඉස්කෝලෙ මහත්තයා' කියල. ඉංග්‍රීසි කතාව සහ ලිවීම ගැන අති දක්ෂයෙක් වූ අයියා සුදු ජාතික ඇඳුමෙන් සැරසුන විට ඉතා තේජවන්ත පෙනුමෙන් යුතුවෙයි. මේ නිසා අයියාට නිතර ජාතික ඇඳුම ඇන්ද වීමට අක්කා උනන්දු කරවයි.

'හා හොඳයි ටීචර්.' කියා සිනාසෙමින් කියූ අයියා තෙල් මල් කපුරු හඳුන් කූරු අප සැමටම රැගෙන පැමිණියේය.

දළදා මාළිගය වැඳ පුදා ගත් අපි පේරාදෙණිය විශ්ව විද්‍යාලයට ඇතුල් වන විට හවස හතරට විතර ඇති. ගලහ පාරට කාරය හැරවූ විට අක්කා කතාව පටන් ගත්තා.

'මේ තමයි මල්ලී මෙඩිකල් ෆැකල්ටි එක. අර පාලමට දකුණෙන් තියෙන්නෙ විජේවර්ධන ශාලාව. ඒකෙ ඉන්නෙ ගෑණු ළමයි විතරයි. අර සයන්ස් ෆැකල්ටි එක......අර තියෙන්නෙ..... ජයතිලක ශාලාව. ආ.....රණේ මෙතනින් වමට හරවන්න. මේ පාරෙ තමයි ධම්මිල ඉන්නව කිව්වෙ.'

'හිල්ඩ එක තියෙන්නෙ කොහේද අක්කෙ.'

'ඒක තියෙන්නෙ ටිකක් ඈත. අපි දැන් ධම්මිලගෙ ගෙදර ගිහිල්ල ටිකකින් එහේ යමු.'

'ධම්මි කිව්ව විදියට මෙක තමයි ගේ. බලන්න මල්ලී නොම්මරේ කීයද කියලා.'

අප කාරය නවත්වන හඬ අසා, ධම්මි අක්කා දුව විත් අක්කා බදාගත්තා. අයියාට ආචාර කළ ඇය අම්මාටත්, නැන්දාටත් වැන්දා. රංග අයියාද එළියට විත් අප හැම පිළිගත්තේ ඉතාමත් කුලුපග ලෙසින්.

මුහුණු සෝදා ඇඳුම් මාරුකර තේ බීමෙන් පසු රංග අයියා, 'එහෙනම් අපි කරුවල වැටෙන්න කලින් මල්ලිට කැම්පස් එක පෙන්නමු නේද?' කියා නැගිට්ටේය. ප්‍රධාන පුස්තකාලයට පිටුපස ඇති පාලම ලඟට අප පළමුව ගියෙමු. එක් පසෙකින් පෙනෙන නිසසල හන්තාන කඳුවැටියත්, අනෙක් පසින් සිලි සිලි ගා ගලන මහවැලි නදියත් දුටු මා පෙර පිං කර ඇති බව සිතුණි. මට එක් වරම සිහි වූයේ කවුදෝ ලියූ කවියක්.

මහවැලි නදිය සිලි සිලි ගා බැස යනවා
ලෙහෙනුන් පලා ගිරවුන් නිති හඬ දෙනවා
හන්තානේ සුළඟ ගත සිත පුබුදනවා
සරසවි මැණියෝ නිති සිහියට එනවා

'මල්ලිටත් ළඟදීම කාව හරි අතින් අල්ලගෙන අර හන්තාන නගින්න පුලුවන් වේවි'. ධම්මි අක්කා මට විහිළු කරයි.

පළමු වසර මෙතරම් ඉක්මනට ගෙවී ගියේ කෙසේ ද යන්න මට සිතා ගැනීමට අපහසු විය. නමුත් ආපසු හැරී බලන විට, සදා නොමැකෙන අමරණීය සටහන් මගේ චිත්‍ර පොතට එක් වී ඇති බව මට හැඟේ. හන්තාන තරණය, නුවර පෙරහැර හා වාර්ෂික නාට්‍ය උළෙල (වල) මා වඩාත්ම ප්‍රිය කරන සිද්ධීන් එම මතක සටහන් අතර ඇත. මේ සියල්ල ගොනු කොට පසුව කතාවක් ලිවීමට සිතා ගතිමි. GAQ විභාගයෙන් සියලුම විෂයයන් සඳහා ඒ සාමාර්ථයන් මට ලැබී තිබූ හෙයින්, මා බලාපොරොත්තු වූ පරිදි වාණිජ්‍ය විශේෂ උපාධිය හැදෑරීමට මට හිමි කම් ලැබුණි.

විභාග වැඩ නිසා, නිශා නංගීව අමතක වී ගොස් තිබුණි. එහෙත් ඇය උසස් පෙළ සමත්ව ඇති බවත්, විද්‍යාව හැදෑරීමට ප්‍රමාණවත් ලකුණු ඇති බවත්, ඇගේ පළමු තේරීම පේරාදෙණිය බවත් මට ලියා එවා තිබුණි. ඇගේ ඒ ලිපියේ අවසාන වැකි කීපය මා කීපවරක්ම කිය වූයේ ඉතාම සතුටින්.

'අයියේ, මට පේරාදෙණිය ලැබෙන්න කියල හැමදාම බුදු සාදුට වැඳල ප්‍රාර්ථනා කරනව. එතකොට මට හැමදාමත් අයියව දකින්න පුලුවන්. මම හිතනව ඒ පැතුම ඉටුවේවි කියල.'

ඊට සති කීපයකට පසු ඇය පේරාදෙණියට තේරී ඇති බවත්, ශාලාව ලෙස විජේවර්ධනය ලැබී ඇති බවත්, අප්‍රියෙල් විසිපස් වෙනිදා උදේ පේරාදෙණියට එන බවත් ලියා තිබුණි. මෙතෙක් කල් නොදැනුන සුවයක් මගේ සිතට දැනෙන්නට විය.

'කොහොමටත් මම නංගිව හොඳින් බලා ගන්න ඕන.'

එදා නවකයන් පැමිණෙන දින මාමා, නැන්දා හා නංගී රැගත් කාරය එනතුරු මා විජේවර්ධන ශාලාව අසල ගැවසෙමින් සිටියේ, වෙනදා නොදැනුන ප්‍රීතියකින්. මම විජේවර්ධනය අසල සිටිනු දුටු සැල් ගුණයා 'ආ සේන අද අලුත් නැව එනව නේද? ඒකද උඹ උදෙන්ම ඇවිත් මෙතන ඉන්නෙ? කොහොම හරි හොඳ කෙනෙක් හොයා ගනින්! උඹටත් තව අවුරුදු තුනක් මෙහේ ඉන්න එපායැ.'

'අනේ නැහැ ගුණේ. මම මේ අපේ මාමල එනකං ඉන්නෙ. මේකෙ තමයි නංගි ඉන්න යන්නෙ.'

'හා හා කමක් නැහැ. කමක් නැහැ සේන. නංගි කියල තමයි පටන් ගන්නෙ. ඊට පස්සෙ.....' ඔහු යමක් ගිල ගත්තේය.

'නංගි මොන ෆැකල්ටි එකේද?'

'සයන්ස් - බයෝ සයන්ස්'

නංගී රැගත් කාරය විජේවර්ධන එක ලඟට හැරෙව්වේය. කාරයෙන් පැනගත් නංගී දුවවිත් මට හාදුවක් දුන්නාය. මාමාටත් නැන්දාටත් වැන්ද මා ඔවුන් කැටුව ගියේ කාර්යාලය දෙසටය. ඊට පසු නුවර ගොස් දළදා වැඳීමෙන් පසු බේක් හවුසියෙන් දවල් ආහාරය ගත් අපි විජයවර්ධන ශාලාව අසළට ගියෙමු. නැවත යාමට සූදානම් වූ නැන්දා 'අනේ පුතේ නංගිව ටිකක් බලාගන්න. එයා කවදාවත් පිට ඉඳල නැහැනේ. පුතා ඉන්න නිසා අපට හිතට කිසිම බයක් නැහැ.' කියා ඇස් දෙක පිසදා ගන්නවා මම දුටුවෙමි. තනි වූ අප දෙදෙනොට පසුගිය අවුරුදු තුන තුළ සිදුවූ බොහෝ දේ කතා කිරිමට තිබිණි. සවස හය පමණ වන තුරු ඇය සමග සිටි මා හිල්ඩාවට ගියේ වෙනදා නැති සතුටකිනි. මගේ රූම් මේට් වූ කුලසූරිය,

'සේන මම දැක්ක නංගි එක්ක ඉන්නව, විජේවර්ධන එක ළඟ. නංගි නම් හරිම හැඩයි වගේ. උඹට ටිකක් ඇහැ ගහගෙන ඉන්න වේවි. නැති නම් කවුරු හරි ඩැහැ ගනීවි. එතකොට උඹට හුලං තමයි.'

'අනේ නැහැ කුලේ. ඒ මගේ නංගි. කොහොමටත් මම එයාව බලා ගන්න ඕන.'

'හොඳයි හොඳයි' කී ඔහු ගේ උපහාසාත්මක හිනාව මට ඇල්ලුවේ නැත. පසුගිය සති කීපය තුළ අපි හැමදාම හමු වුණා. අපට කතා කිරීමට බොහෝ දේ තිබුණා. විශේෂයෙන්ම අපේ අතීතය ගැන.

➔

අපේ පොඩි කාලෙ ගැන. ඒත් දිනක්, ඇය කළ ආයාචනය ගැන මම සිහිපත් කරන්නේ හරිම සතුටින්.

'සේන අයියා මීට පස්සෙ මට නිශා කියන්න. නංගි කියන්න එපා. මම නිශා කියනවට හරිම කැමතියි. මමත් ඔයාට සේන කියන්නම්. සේන කියන එක හරිම ලස්සනයි.'

'ඒ ඇයි?'

'මට ඔයාට කියන්න ලොකු දෙයක් තියෙනව. තරහ වෙන්නෙ නැහැ කියන්න ඒක අහල.. මට පොරොන්දු වෙන්න.'

'ඔව් මම පොරොන්දු වෙන්නම්'

'ඔයාල මොරටුවෙන් ආවට පස්සෙ මම දවස් කීපයක්ම ඇඬුව. මම අම්මට දොස් කීව, ඔයාලට මොරටුවෙන් යන්න උනේ අපි නිසා කියල. මම කීව ලොකු උනාම නැන්දගෙන් අම්මල ගත්ත දේපල ඔක්කොම නැන්දට ආපසු දෙනව කියල.' ඇය නොනැවතී කියාගෙන යයි. ඇගේ ඇස් වල කඳුළු පිරිල.

ඊට පස්සෙ තාත්ත මගේ ළඟට ඇවිත් කිව්ව 'අනේ දුවේ උඹ ඒක කීව එකත් මගෙ හිතට සැනසීමක්. කවද හරි නැන්දගෙ උරුමය එයාට දෙන්න. එතකොට මට සහනයෙන් ජීවත් වෙන්න පුලුවන්.' කියල දිග සුසුමක් පිට කළා. ඔහුගේ හිතේ කියාගන්න බැරි දේවල් හුඟක් තියෙනව කියල මට දැනුණා.

'සේන ඔයා ගැන මගේ හිතේ ලොකු ආදරයක් තියෙනව. ඒක අද ඊයෙ ඇති උන දෙයක් නෙවි. මට හිතෙන්නෙ ආත්ම ගණනාවක ඉඳල පැවතෙන එකක් කියල.'

'ඔව් නිශා මටත් ඒක කියා ගන්න බැරුවයි හිටියෙ. ඒත් ඔයා ඉස්සර උනා.'

'අයිය. නැහැ නැහැ සේන දන්නෙ නැතිව ඇති ඔයාල ගියදා ඉඳල මම බුදු සාදුට මල් තියල වැඳල ප්‍රාර්ථනා කළා, මගෙ සේන අයිය මටම ලබා දෙන්න කියල. මම බයේ හිටිය ·ඔයාල අනුරාධපුරේ ගියාට පස්සෙ අලුත් යාළුවෙක් හම්බ වෙයි කියල.'

එවර නිවාඩුවට ගෙදර යන විට මා නිශාට කීවේ, එය දෙමාපියන්ට දන්වා අවසර ලබාගන්නා ලෙසයි.

මගේ කතාව ඇසූ අයියා, අක්කා හා අම්මා ඉතාම සතුටට පත් වුණා.

'ඒත් පුතේ අපි තව ටිකක් බලමු , මාමල මොකද කියන්නෙ කියල. වැඩිහිටි ආශිර්වාදය විවාහයකදී හරිම වැදගත්. ' කියා දිග සුසුමක් හෙලූ අම්මා යමක් ගිල ගත්තේ ඇගේ අතීතය සිහිවීමෙන් වෙන්න ඇති.

'කොහොමටත් පොඩි පුතේ, ඔය නිශා කෙල්ල පොඩිකාලෙ ඉඳල උඹට හරිම ලෙන්ගතුයි. ඒකි හරිම හොඳ අහිංසක කෙල්ල. අයිය වගේමයි. අනෙක ඇවැස්ස නෑ කමටත් එයා අයිති උඹට නේ. අයියලගෙ විරුද්ධත්වයක් නැත්නම් ඒක හරිම වාසනාවක්.'

මීට දින කීපයකට පසු අම්මා නමට ලිපියක් ලැබුණි. එය මාමාගෙන් බව අප දැනගත්තේ, ඇගේ විස්තර ඇසීමෙන්. අප තිදෙන කැඳවූ අම්මා 'පුතේ මාමා කියල තියෙනව, නිශා දුව විස්තරේ එයාට කීව කියල. ඒ දෙන්නත් ඒකට හරිම කැමතිලු. එහෙම දෙමාපිය ආශිර්වාදය ලැබෙන එක හරිම වාසනාවක්. මටත් දැන් හරිම සැනසීමක්.'

'මල්ලිට දැන් හරිම සතුටු ඇති.' කියමින් අක්කා ගෙනා තේ කෝප්පයේ අද අමුතුම රසයක් ඇති බව මට දැනුණි.

'තේ එක නම් අද හරිම රසයි. අක්කෙ මොනවද දැම්මෙ. '

'හිත සතුටු නම් ඕනම රසයක් අතිරසයක් වෙනව කියන්නෙ ඕකනෙ ළමයෝ.' අක්කා මහ හඬින් හිනාවෙයි.

'තතෝ නං සුඛ මං වේතී - ඡායාව අන පායිනී' අක්කාට බණ පදයක් මතක් වෙයි.

තේ එක බිව්ව මා කෝප්පය අක්කා අතට දුන්නේ දහසක් පැතුම් මාළිගා හද තුළ පුරවාගෙන.

අම්මා ඇවිත් මගේ හිස අත ගෑවේ හරිම සෙනෙහසකින්.

-- නිමි --